පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 8 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මාර්තු මස 21 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිළ : රු. 12.25 යි

තැපැල් ගාස්තුව : රු. 6.75 යි

# 2003 අංක 8 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 17 වන දින]

එල්. ඩී.–ඕ. 29/99.

**1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2003 අංක 8 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට, ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර, ඉහත දඬුවමට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදලක් ගෙවීමට සේවායෝජකයාට ආඥා කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 1956 අංක 47 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ වගන්තිය සංශෝධනය කිරීම

"(3) (2) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසි උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු රාත්‍රි කාලයෙහි සේවයේ නියුක්ත කරවනු ලැබූ අවස්ථාවක, එකී උල්ලංඝනය කිරීම ආරෝපණය කළ හැකිවන්නේ සේවායෝජකයාගේ සහ වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාවකට හෝ පැහැරහැරීමකට ද, එකී සේවා යෝජකයා සහ වෙනත් යම් තැනැත්තා (සේවයෙහි

නියුක්ත තැනැත්තා හැර) මේ පනත යටතේ වරදක වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර, තරුණ අය සම්බන්ධයෙන් පමණක් ඒ තරුණ අය වයස අවුරුදු දහඅටකට අඩුවන අවස්ථාවක දී, ඉහත දඬුවමට අමතරව වරද සිදු කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස සේවායෝජකට ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "කම්කරු කොමසාරිස්" යන්නට "අතිරේක කම්කරු කොමසාරිස්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු සහ සහකාර කම්කරු කොමසාරිස්වරයකු ද ඇතුළත් වේ."

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට, ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ කදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ඇ) "වීථි වෙළෙඳාම" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.



ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබූ වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට, "රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**9.** 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"කාර්මික ව්‍යවසාය තුළ තරුණ අයගේ සේවා නියුක්තිය සම්බන්ධයෙන් තොරතුරු සැපයීම.

8අ. (1) යම් කාර්මික ව්‍යවසායක සේවයෙහි නියුක්තව සිටින යම් තරුණ අයකුගේ සේවා යෝජකයා විසින් සහ එකී තරුණ අයගේ දෙමාපියන් හෝ භාරකරු විසින්, යම් බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලබන්නේ නම්, එකී තරුණ අයගේ සේවා නියුක්තිය පිළිබඳව එකී නිලධරයා විසින් ඉල්ලා සිටිනු ලබන ආකාරයේ තොරතුරු, එකී නිලධරයාට සැපයිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ කාර්මික ව්‍යවසායක යම් තරුණ අයකුගේ සේවා නියුක්තිය පිළිබඳව බලයලත් නිලධරයකුට හිතාමතාම වැරදි තොරතුරු සපයන යම් සේවායෝජකයකු, දෙමව්පියන් හෝ භාරකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය –

(අ) එහි (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීමෙන් ; සහ

(ආ) එහි (4) වන උපවගන්තියේ, "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ, අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත



"(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම සේවායෝජකයකු ම වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) (1) වන උපවගන්තියේ "බලයලත් නිලධරයා" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :-

"බලයලත් නිලධරයා" යන්නෙන් කම්කරු කොමසාරිස්වරයා, අතිරේක කම්කරු කොමසාරිස්වරයා, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු සහ සහකාර කම්කරු කොමසාරිස්වරයකු අදහස් වන අතර ඊට යම් වෛද්‍ය නිලධරයකු, කර්මාන්තශාලා පරීක්ෂා කිරීමේ ප්‍රධාන ඉංජිනේරුවරයා, කර්මාන්තශාලා පරීක්ෂා කිරීමේ ඉංජිනේරුවරයකු, යම් කම්කරු නිලධරයකු හෝ කම්කරු දෙපාර්තමේන්තුවට සම්බන්ධ යම් සංඛ්‍යාලේඛන නිලධරයකු හෝ යම් සංඛ්‍යාලේඛන විශේෂඥයකු ද ඇතුළත් වේ." ;

(ආ) "ළමයා" යන යෙදුමේ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :-

"අන්භාරකරු" යන්නෙන් ළමයාගේ භාරකාරත්වය දැරිය යුතු වන්නා වූ සහ ළමයා වෙනුවෙන් ඒ ළමයාගේ කටයුතු කළමනාකරණය කළ යුතු ද වූ, අධිකරණයක් විසින් පත් කරනු ලැබූ යම් නෑනෑත්තකු අදහස් වේ.".

(ඇ) එහි (3) උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) එහි (1) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) යම් රජයේ වෛද්‍ය නිලධරයකු විසින් ඉහත (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කරනු ලබන අවස්ථාවක ඔහු විසින් පරීක්ෂා කරනු ලැබූ එකී තරුණ අයගේ හෝ ළමයාගේ වයස සම්බන්ධයෙන් සහතිකයක් නිකුත් කිරීම එකී වෛද්‍ය නිලධරයාගේ කාර්යය වන්නේ ය. තව ද, එකී සහතිකය අධිකරණයක දී සාක්ෂි වශයෙන් පිළිගත හැකි අතර එහි සඳහන් කරුණු පිළිබඳ බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුත්තේ ය." ;

(ආ) එහි (2) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—



කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස සේවා යෝජකට ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්,

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් පනහකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන හෝ තදනන්තර වරදක් සඳහා රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උප වගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ළමයින් සේවයේ නියුක්ත කරවීම පිළිබඳ සීමා.

13. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධානවලට අනුකූලව හැර <u>කිසිදු ළමයකු සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය.</u>

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ළමයකු සේවයෙහි නියුක්ත කරවනු ලබන අවස්ථාවක, ඒ උල්ලංඝනය කිරීම ආරෝපණය කරනු ලැබිය හැක්කේ කාගේ

ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට ද ඒ ක්‍රියාව හෝ පැහැර හැරීම කරන සේවායෝජකයා හෝ (සේවයෙහි නියුක්ත කරවනු ලැබූ ළමයා හැර) වෙනත් යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක වන්දි මුදලක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

“ මව්පියන් හෝ භාරකරුවන් විසින් ළමයින් සේවයේ නියුක්ත කරවීම.

14. (1) ළමයකු -

(අ) දිනපතා, පාසල ආරම්භවීමේ විධිමත් වේලාවන්ට පෙර හෝ පාසල අවසන් වීමේ වේලාවට පසුව ඔහුගේ දෙමව්පියන් හෝ භාරකරු විසින්, ඒ පවුලේම සාමාජිකයන් විසින් කරගෙන යනු ලබන සැහැල්ලු කෘෂිකාර්මික හෝ උද්‍යාන වැඩ කටයුතුවල හෝ ඒ හා සමාන වැඩ කටයුතුවල හැර ; හෝ

(ආ) යම් රාජ්‍ය අධිකාරියක් විසින් අධීක්ෂණය කරනු ලබන්නා වූ සහ යම් වෘත්තීය පුහුණුවක් හෝ රැකියාවක් සඳහා යම් තාක්ෂණික අධ්‍යයනයක් හෝ අන් පුහුණුවක් ලබා දෙන්නා වූ යම් පාසලක් හෝ අන් ආයතනයක හැර,

සේවයේ නියුක්ත කරවනු නොලැබිය යුතු ය.



(ආ) එහි (2) වන උපවගන්තියේ -

(අ) “යම් සේවායෝජකයකු, මව්පියන් හෝ භාරකරු” යන වචන වෙනුවට “යම් සේවායෝජකයකු, මව්පියන්, අන්භාරකරු හෝ භාරකරු” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) “රුපියල් දහසකට” යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට “රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ “රුපියල් දහසකට” යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට “රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) ඒ වගන්තියේ පැති සටහන ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :-

“ඇතුළු වීමේ සහ සෝදිසි කිරීමේ බලතල” ;

(ආ) එහි (1) වන උපවගන්තියේ “ඇතුළු විය හැකි ය” යන වචන වෙනුවට “ඇතුළු වී සෝදිසි කරනු ලැබිය හැකි ය” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල ආරම්භයේ සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවීමට ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඈ) එහි (4) වන උපවගන්තියේ "වයස අවුරුදු දහහතර" යන වචන වෙනුවට "වයස අවුරුදු දහසය" යන වචන ආදේශ කිරීමෙන් සහ "වයස අවුරුදු දහසය" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(අ) එහි (1) වන උපවගන්තියේ "සේවායෝජක, මව්පියන්, හෝ භාරකරු" යන වචන වෙනුවට "සේවායෝජක, මව්පියන්, අත්භාරකරු හෝ භාරකරු" යන වචන ආදේශ කිරීමෙන් ;



(2) (1) වන උපවගන්තියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කොට ළමයකු සේවයේ නියුක්ත කරවනු ලැබුවේ නම්, ඒ උල්ලංඝනය කිරීම ආරෝපණය කරනු ලැබිය හැක්කේ කාගේ ක්‍රියාවකට හෝ පැහැර හැරීමකට ද, ඒ ක්‍රියාව හෝ පැහැර හැරීම කරන සේවායෝජකයා හෝ වෙනත් යම් තැනැත්තකු (සේවයෙහි නියුක්ත කරවනු ලැබූ ළමයා හැර) මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක වන්දි මුදලක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ " මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ බලය දෙනු ලැබිය හැකි" යන වචන ඉවත්කොට ඒ වෙනුවට " මේ පනතේ මේ කොටසේ විධිවිධාන මගින් බලය දෙනු ලැබිය හැකි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(අ) එහි (1) වන උපවගන්තියේ " යම් ළමයකුගේ සේවායෝජක සහ ඒ ළමයාගේ මව්පියන් හෝ භාරකරු" යන වචන වෙනුවට " යම් ළමයකුගේ සේවායෝජක සහ ඒ ළමයාගේ මව්පියන්, අත්භාරකරු හෝ භාරකරු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (2) වන උපවගන්තියේ–

(i) "යම් සේවායෝජකයකු, මව්පියන් හෝ භාරකරු" යන වචන වෙනුවට "යම් සේවායෝජකයකු, මව්පියන්, අත්භාරකරු හෝ භාරකරු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදුකරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර ඊට අමතරව වරද සිදු කරනු ලැබුවේ කවර ළමයකු සම්බන්ධයෙන් ද, ඒ ළමයා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (1) වන උපවගන්තියේ "වයස අවුරුදු දහසයක්" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටක්" යන වචන ආදේශ කිරීමෙන් ;



(ආ) එහි (2) වන උපවගන්තියේ -

(i) "වයස අවුරුදු දහසයක්" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) "රුපියල් දහසකට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට ඒ වෙනුවට "රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු අතර වරද සිදුකරනු ලැබුවේ කවර තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත අධිකරණය විසින් නිශ්චය කරනු ලබන වන්දි මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස ද ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ වගන්තියේ පැති සටහනේ "වයස අවුරුදු දහසය" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(අ) එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(1) අන්තරායදායක ස්වභාවයේ ක්‍රියාවන්හි යෙදවීම සඳහා වයස අවුරුදු දහසයට එළඹ නොමැති කිසිදු ළමයකු හෝ තරුණ අයකු පුහුණු කිරීම, නොකළ යුතු ය";

(ආ) එහි (2) වන උපවගන්තියේ, "වයස අවුරුදු දහසයට අඩු" යන වචන වෙනුවට "වයස අවුරුදු දහඅටට අඩු" යන වචන ආදේශ කිරීමෙන්